*මෙම උපදෙස් පත්‍රිකාව හොඳින් කියවා අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමටත්, අදාළ ලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමටත් කටයුතු කිරීමෙන් සිදුවිය හැකි අනවශ්‍ය ප්‍රමාදයන් වලක්වා ගත හැකි බව කාරුණිකව සලකන්න.*

**2012 අංක 02 දරණ පනතින් සංශෝධිත 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව නිවාස කාර්යය සහ වෛද්‍ය ප්‍රතිකාරවල කාර්යය සඳහා සේවක අර්ථසාධක අරමුදලින් 30%ක් ප්‍රතිලාභ ගෙවීම.**

## උපදෙස් පත්‍රිකාව

සේවක අර්ථසාධක අරමුදලේ සෑම සාමාජිකයකු සඳහාම, නිවාස කාර්යය සඳහා හෝ වෛද්‍ය ප්‍රතිකාරවල කාර්යය සඳහා ඔහුගේ පෞද්ගලික ගිණුමේ බැරට ඇති මුදලින් සියයට තිහක් (30%) නොඉක්මවන ප්‍රතිශතයක් ආපසු ගැනීමට හිමිකම ඇත. මෙසේ ආපසු ගැනීමට හැකි උපරිම මුදල් ප්‍රමාණය රුපියල් මිලියන දෙකක් (රු.2,000,000.00) වේ.

නිවාස කාර්යය සහ වෛද්‍ය ප්‍රතිකාර කාර්යය සඳහා පහත සුදුසුකම් සපුරාලන සාමාජිකයින්ට මෙම ප්‍රතිලාභ ක්‍රමය සඳහා අයදුම්කළ හැකිය.

i. වසර දහයකට නොඅඩු කාලයක් සඳහා අරමුදලට දායක මුදල් ගෙවා තිබීම.
ii. දැනට සේවයේ නියුක්තව සිටීම.
iii. සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ ඔහුගේ බැරට රුපියල් ලක්ෂ තුනකට නොඅඩු මුදලක් තිබීම (එනම් ප්‍රතිලාභ ඉල්ලුම්කරන අවස්ථාව වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විගණනය කරන ලද සාමාජික ගිණුම් ශේෂය රුපියල් ලක්ෂ තුනකට නොඅඩු විය යුතුය.)

පළමුවර 30% ප්‍රතිලාභ ලබා ගත් සාමාජිකයෙකුට එතැන් සිට වසර 10ක් සම්පූර්ණ කිරීමෙන් පසු දෙවන වරට 30% ප්‍රතිලාභ ලබා ගත හැකිය.

**"නිවාස" කාර්යය සඳහා 30% ප්‍රතිලාභ ලබාගත හැකි අවස්ථා ;**

i. සාමාජිකයාට අයත් ඉඩමක නිවසක් ඉදිකිරීම.
ii. නිවසක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම.
iii. නිවාස දේපළක් මිල දී ගැනීම.
iv. නිවාස දේපළක් මත ඇති උකසක් බේරුම් කිරීම.
v. අනුමත බැංකුවකින් ලබාගත් නිවාස ණයක ඉතිරි මුදල බේරුම් කිරීම.

**"වෛද්‍ය ප්‍රතිකාර" කාර්යය සඳහා 30% ප්‍රතිලාභ ලබාගත හැකි අවස්ථා ;**

i. බයිපාස් නොවන හෘදය සැත්කම
ii. බයිපාස් සැත්කම
iii. සැත්කම් ඇතුළුව පිළිකා සඳහා ප්‍රතිකාර
iv. වකුගඩු බද්ධ කිරීම් හෝ සැත්කම්
v. සිසේරියන් සැත්කම හෝ
vi. අනතුරක් සිදුවීම හේතු කොටගෙන දින දාහතරකට නොඅඩු කාලයක් රෝහල් ගතව සිටීම.

**සැලකිය යුතුයි:-**

- වෛද්‍ය ප්‍රතිකාර කාර්යය සඳහා උපදෙස් පත්‍රිකාවේ දැක්වෙන ප්‍රතිලාභ ලබා ගත හැකි අවස්ථා 06 ට අමතරව වෙනත් කිසිදු කරුණක් සඳහා ප්‍රතිලාභ ඉල්ලුම් කළ නොහැකිය.

**01.** නිවාස කාර්යය

**(අ)** **නිවසක් ඉදි කිරීම හා ඉඩමක්/ නිවාස දේපළක් මිලදී ගැනීම සඳහා.**

| | **නිවසක් ඉදිකිරීම** | |
|---|---|---|
| 01 | සාමාජිකයා නමින් පවතින ඉඩමේ හිමිකම් ඔප්පුවේ මුල් පිටපත හා එහි ඡායා පිටපතක් | |
| 02 | අදාළ ප්‍රාදේශීය සභාව හෝ පළාත් පාලන ආයතනය විසින් අනුමත කරන ලද ඉදිකිරීමට නියමිත නිවසේ, නිවාස සැලසුමේ මුල් පිටපත හා එහි ඡායා පිටපතක් | |
| | පළාත් පාලන ආයතනවලින් අනුමත කිරීම අවශ්‍ය නොවන ප්‍රදේශ සඳහා, අදාල නිවාස සැලසුම අවම වශයෙන් වරලත් ඉංජිනේරුවරයෙකු හෝ වරලත් ගෘහනිර්මාණශිල්පියකු විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය. | |
| 03 | ඉඩමේ අයිතිය තහවුරු කිරීම සඳහා වන ප්‍රසිද්ධ නොතාරිස්වරයාගේ සහතිකය<br>(මෙම ආකෘතිපත්‍රය ප්‍රතිලාභ අයදුම්පත සමඟ අමුණා ඇත.) | |

| | **ඉඩමක්/ නිවාස දේපළක් මිලදී ගැනීම** | |
|---|---|---|
| 01 | ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද විකුණුම්කරුගේ හිමිකම් ඔප්පුවේ පිටපත | |
| 02 | එම ඉඩමට අදාලව ප්‍රතිලාභ ඉල්ලුම් කරන දිනට *මාස 06ක් ඇතුළත* සකස් කරනලද හිමිකම් වාර්තාව | |
| 03 | අවමය වසර 10කට අදාළව පෙළපත් සටහන සමඟ පත්ඉරුවල මුල් පිටපත හා එහි ඡායා පිටපත් | |
| 04 | ඉඩමේ අයිතිය තහවුරු කිරීම සඳහා වන ප්‍රසිද්ධ නොතාරිස්වරයාගේ සහතිකය<br>(මෙම ආකෘතිපත්‍රය ප්‍රතිලාභ අයදුම්පත සමඟ අමුණා ඇත.) | |
| 05 | ඉඩම/නිවස සාමාජිකයාට විකිණීමට කැමති බවට විකුණුම්කරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය (ලිපියේ ආදර්ශයක් ප්‍රතිලාභ අයදුම්පත සමඟ අමුණා ඇත.) | |
| | නිවාස දේපළක් මිලදී ගන්නේ නම් ඉදි කරන ලද නිවසේ සැලැස්ම හා එහි ඡායා පිටපතක් | |
| 06 | මිලදී ගන්නා ඉඩම ජීවිත භුක්තිය සහිත නම්, ජීවිත භුක්තිය අතහරින බවට නීතිඥවරයකු ඉදිරියේ ජීවිත භුක්ති හිමිකරු කරන ලද ප්‍රකාශය හෝ ජීවිත භුක්ති හිමිකරු මිය ගොස් නම් මරණ සහතිකයේ සහතික කළ පිටපත | |

**සැලකිය යුතුයි:-**

- නිවසක් සෑදීම සඳහා ඉල්ලුම් කිරීමේ දී දීර්ඝ කාලීන බලපත්‍රය වලංගුවන අතර වාර්ෂික බලපත්‍රය සඳහා ප්‍රතිලාභ ලබා දිය නොහැකිය.
- මිලදී ගන්නා ඉඩම හෝ නිවාස දේපළ, එය අයත් පළාත් පාලන ආයතනය මඟින් නීත්‍යානුකූලව නිවසක් ඉදි කිරීම සඳහා අනුමත කරනු ලබන *අවම බිම් ප්‍රමාණය* හෝ ඊට වැඩිවන පරිදි ඉදිරිපත් කළ යුතුය.
- ඉඩමක් මිලදී ගැනීම සඳහා "බිම් සවිය" යටතේ ලබා ගත් හිමිකම් සහතිකයක් ඉදිරිපත් කිරීමේදී අවසාන පත්ඉරුව අත්‍යවශ්‍ය වේ.

**01. (ආ)** **නිවාස දේපළක් උකස්කරයකින් නිදහස් කර ගැනීම සඳහා,**

i. බැංකු කළමණාකරු විසින් සහතික කරන ලද උකස් ඔප්පුවේ පිටපත ☐

ii. අදාළ බැංකු කළමණාකරු විසින් සහතික කරන ලද පහත සඳහන් කරුණු ඇතුලත් ලිපිය

- උකස්කරයේ වටිනාකම ☐
- ගෙවිය යුතු හිඟ මුදල ☐
- උකස් ඔප්පුවේ අංකය ☐

**(ඇ)** **අනුමත බැංකුවකින් ලබා ගත් නිවාස ණය මුදලක් ගෙවා නිම කිරීම සඳහා,**

සාමාජිකයා විසින් ලබා ගත් නිවාස ණය මුදල පිළිබඳ පහත තොරතුරු ඇතුළත් බැංකු කළමණාකරුගේ සහතිකය ☐

- ණයලාභියාගේ නම ☐
- ලබාගෙන ඇත්තේ නිවාස ණය මුදලක් යන වග
- ලබාගත් නිවාස ණය මුදලේ ප්‍රමාණය ☐
- ඉල්ලුම් කරන දිනට ණය ශේෂය ☐

**සැලකිය යුතුයි:-**

- **මෙහිදී, සාමාජිකයා විසින් ලබාගත් ණය මුදලෙහි ශේෂය ගෙවා ඉතිරි ප්‍රතිලාභ මුදලක් වේ නම් නිවාස කාර්යයට අදාල වෙනත්ලියකියවිලි ඉදිරිපත් කර එම මුදල ලබා ගත හැකිය.**

**02.** වෛද්‍ය ප්‍රතිකාර

**1) වෛද්‍ය ප්‍රතිකාර කාර්යය සඳහා ප්‍රතිලාභ ඉල්ලුම් කරන සාමාජිකයින් විසින් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු වෛද්‍යවරයාගේ සහතිකයේ (මෙම ආකෘති පත්‍රය ප්‍රතිලාභ අයදුම් පත්‍රය සමග අමුණා ඇත.)**

- පළමු කොටස රෝගියා පරීක්ෂ කළ වෛද්‍යවරයා විසින් ද ☐
- දෙවන කොටස -
  - i. රජයේ රෝහලක නම් රෝහල් අධ්‍යක්ෂ/ වෛද්‍ය අධිකාරී හෝ ඔහු විසින් බලය පවරා දෙන ලද යම් නිලධාරියෙකු විසින් ද ☐
  - ii. පෞද්ගලික රෝහලක නම් එහි පරිපාලන කළමණාකරු විසින් ද සහතික කළ යුතුය. ☐

**2) ඉල්ලුම්කරු කලත්‍රයා හෝ දරුවන්ගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රතිලාභ ඉල්ලුම් කරන්නේ නම්,**

- i. විවාහ සහතිකයේ මුල් පිටපත හා එහි ඡායා පිටපතක් ☐
- ii. දරුවාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත හා එහි ඡායා පිටපතක් ☐

**සැලකිය යුතුයි:-**

- **අරමුදලේ සාමාජිකයා, ඔහු හෝ ඇයගේ කාලත්‍රයා හෝ ළමුන් සඳහා ප්‍රතිකාර ලබා ගත් දින සිට දින 90ක් ඇතුළත මේ යටතේ ප්‍රතිලාභ ඉල්ලුම් කළ යුතුය.**

<u>**ප්‍රතිලාභ අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී සැලකිය යුතු කරුණු**</u>

1. ප්‍රතිලාභ අයදුම්පත නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතු අතර පහත සඳහන් ස්ථානවල අදාල අත්සන්, නිලමුද්‍රා හා දින යෙදිය යුතුයි.
   - බැංකු ගිණුම් විස්තර අවසානයේ සාමාජිකයාගේ අත්සන හා දිනය ☐
   - නම් සහතික කිරීම අවසානයේ සේවායෝජකගේ අත්සන, නිලමුද්‍රාව ☐
   - සාමාජිකයාගේ මහපටැඟිලි සලකුණ සහතික කිරීම සඳහා සේවායෝජකගේ අත්සන, නිලමුද්‍රාව ☐
   - අයදුම්පතේ II කොටස අවසානයේ සේවායෝජකගේ අත්සන, නිලමුද්‍රාව හා දිනය ☐
2. ප්‍රතිලාභ අයදුම්පත භාර දෙන දිනට මාස තුනකට පෙර සේවායෝජක විසින් සහතික කර ඇති අයදුම්පත් සමඟ ඒ වන විටත් එම ආයතනයේ සේවය කරන බවට සේවා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ☐

<u>**සාමාජිකත්වය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන**</u>

1. වර්තමාන සාමාජික අංකය සහිත “B” සාමාජික පත්‍රයේ සේවායෝජක සහතික කළ පිටපත
2. කලින් සේවය කළ වෙනත් ආයතන වේ නම් එම සාමාජික අංකවලට අදාල “B” සාමාජික පත්‍ර. (කලින් සේවය කළ ආයතන වසා ඇති විට “B” සාමාජික පත්‍ර නොමැති නම් සේවය කළ එක් එක් සේවායෝජකයින්ගෙන් ලබාගත් සේවා සහතික, පත්වීම් ලිපි, වැටුප් වාර්තා යනාදිය මගින් සේවය සනාථ කළ යුතුය.)
3. ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපත **(පළුදු වූ හෝ අපැහැදිලි ජාතික හැඳුනුම්පත් භාර ගනු නොලැබේ)** ☐
4. ප්‍රතිලාභ බැර කළයුතු බැංකු ගිණුම් අංකය, බැංකුවේ නම, ශාඛාව හා ලිපිනය දැක්වෙන බැංකු පොත හා ඡායා පිටපත හෝ ජංගම ගිණුමක් නම් මෑතකදී ලබා ගත් ගිණුම් ප්‍රකාශය (නිවාස ණයක් පියවීම සඳහා ප්‍රතිලාභ ඉල්ලුම් කරන්නේ නම් ණය ලබාගත් බැංකුවේම ඔබ නමට ඇති ගිණුමක තොරතුරු ඉදිරිපත් කළ යුතුය.) ☐
5. සේ.අ.අ. ශේෂය ඇපයට තබා නිවාස ණය ලබාගෙන ඇතිනම් හෝ නිවාස ණය ඉල්ලුම් කර ණය ලබා නොගත්තේ නම්;
   - i. ණය ලබාගෙන එය ගෙවා අවසන් වී නොමැති නම්, S ආකෘති පත්‍රය සමඟ ලබාදෙන නිවාස ණය ආකෘති පත්‍රයේ A කොටස I ණය ලබා ගත් බැංකුවෙන් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. ☐
   - ii. ණය ලබාගෙන එය ගෙවා අවසන් වුවත් ණය අංකය ඉවත් වී නොමැති නම් S ආකෘති පත්‍රය සමඟ ලබාදෙන නිවාස ණය 14 ආකෘති පත්‍රය අදාල කම්කරු කාර්යාලයෙන් හා බැංකුවෙන් සහතික කර ඉදිරිපත් කළ යුතුය. ☐

iii. නිවාස ණය ඉල්ලුම් කළ ද ණය ලබා නොගත්තේ නම්, අදාල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය මගින් සේවක අර්ථසාධක අරමුදල් ණය ගිණුම් සක්‍රීය කරවා ගැනීමෙන් පසු ප්‍රතිලාභ අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

සැළකිය යුතුයි :-

**සේවක අර්ථසාධක අරමුදල ඇපයට තබා ණය මුදලක් ලබාගෙන ඇත්නම් එම ණය මුදල ගෙවීම පළමුව සිදු කළයුතු අතර ඉතිරි ප්‍රතිලාභ මුදලක් වේ නම් වෙනත් දේපළ හෝ නිවාස කාර්යයට අදාල ලියකියවිලි ඉදිරිපත් කර එම මුදල ලබා ගත හැකිය.**

<u>පොදු උපදෙස්</u>

01. ප්‍රතිලාභ ඉල්ලුම් කරන සාමාජික අංක යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සඳහන් ඔබගේ නම සහ ජාතික හැඳුනුම්පතේ සඳහන් නම අතර වෙනසක් ඇතොත් අදාළ සේවායෝජක වෙතින් ලබාගත් ලිපියක්, ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය හා නිවැරදි බී කාඩ්පත හෝ එහි සහතික කළ පිටපතක් සහිතව නම නිවැරදි කරගන්න.
ආයතනය/ආයතන වසා ඇත්නම් එම සාමාජික අංක සඳහා හානි පූර්ණ ලිපිය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

02. ඔබ විසින් මේ වන විටත් සේ.අ.අ.ඇපයට තබා නිවාස ණය මුදලක් ලබාගෙන ඇත්නම් ඔබට වෛද්‍ය ප්‍රතිකාර කාර්යය සඳහා සේ.අ.අ. මුදලින් 30% ක ප්‍රතිලාභ මුදල් ඉල්ලුම් කළ නොහැකි බව සලකන්න.

03. ඔබට 30% ප්‍රතිලාභ අයදුම් කළ හැක්කේ විද්‍යුත් මාධ්‍යයෙන් ලබා ගන්නා ලද ඇඟිලි සලකුණු සහ ජාතික හැඳුනුම්පත් අංකය සමඟ සේවක අර්ථසාධක අරමුදලේ මේ වන විට ලියාපදිංචි වී ඇත්නම් පමණි. ඒ සඳහා ලියාපදිංචි වී නොමැති නම් සේවායෝජක සහතික කළ ඇඟිලි සලකුණු ලියාපදිංචි කිරීමේ අයදුම්පත ද ප්‍රතිලාභ අයදුම්පත සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න. (අදාල ඇඟිලි සලකුණු ලියාපදිංචි කිරීමේ අයදුම්පත ඔබට ප්‍රතිලාභ අයදුම්පත සමග ලබාගත හැකිය.)

<u>ගොනු භාරදීම</u>

04. වෛද්‍ය ප්‍රතිකාර කාර්යය සඳහා සේ.අ.අ. 30% ප්‍රතිලාභය ඉල්ලුම් කරන සාමාජිකයින්හට අදාළ ලිපිලේඛන දිවයිනේ ඕනෑම සේ.අ.අ. 30% ප්‍රතිලාභ ගෙවීම් අංශයකට භාර දීමට කටයුතු කල හැකි අතර, <u>නිවාස කාර්යය සඳහා සේ.අ.අ. 30% ප්‍රතිලාභය ඉල්ලුම් කරන සාමාජිකයින් පමණක් අදාළ ලිපිලේඛන තමන් පදිංචි දිස්ත්‍රික්කය අයත් හෝ පදිංචි ලිපිනයට ආසන්නතම පහත සඳහන් කලාප කම්කරු කාර්යාල හා දිස්ත්‍රික් කම්කරු කාර්යාල වෙත ඔබ විසින්ම පැමිණ භාර දීමට කටයුතු කළ යුතුය.</u>

i. කොළඹ දිස්ත්‍රික්කය - කම්කරු මහ ලේකම් කාර්යාලය, නාරාහේන්පිට, සේවක අර්ථසාධක අරමුදල් 30% ප්‍රතිලාභ ගෙවීම් අංශය (දුර: 011-2501249, 011-2368251, 011-2368252)
ii. කුරුණෑගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය, කුරුණෑගල (දුර: 037-2223590, 0372223141)
iii. උතුරු මැද කලාප කම්කරු කාර්යාලය, අනුරාධපුරය (දුර: 025-2050290, 025-2234537)
iv. සබරගමුව කලාප කම්කරු කාර්යාලය, රත්නපුර (දුර: 045-2222166, 036-2222308)
v. දකුණු කලාප කම්කරු කාර්යාලය, ගාල්ල (දුර: 091-2244649, 091-2232341)
vi. ඌව කලාප කම්කරු කාර්යාලය, බදුල්ල (දුර: 055-2231510)
vii. බස්නාහිර කලාප II කම්කරුකාර්යාලය, කළුතර(දුර: 034-2224854, 034-2229511)
viii. මධ්‍යම කලාප කම්කරු කාර්යාලය, මහනුවර (දුර: 081-2200422, 081-2204503)
ix. උතුර කලාප කම්කරු කාර්යාලය, යාපනය (දුර: 021-2217703, 021-2226333)
x. නැගෙනහිර කලාප කම්කරු කාර්යාලය, ත්‍රිකුණාමලය (දුර: 026-2227390, 026-2227395)
xi. බස්නාහිර කලාප III කම්කරු කාර්යාලය, ගම්පහ (දුර: 033-2234252, 033-2226862)